# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2363/83 - 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**06 වන සංශෝධනය**

ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය

2014 ඔක්තෝබර් 11 දිනැති 1883/17 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ඩබ්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2023 දෙසැම්බර් මස 15 වැනි දින.

I කොටස

සංශෝධනය අංක 01 - 2016 ජනවාරි මස 18 දිනැති අංක 1950/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*<br>
සංශෝධනය අංක 02 - 2016 අගෝස්තු මස 24 දිනැති අංක 1981/45 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*<br>
සංශෝධනය අංක 03 - 2016 දෙසැම්බර් මස 09 දිනැති අංක 1996/46 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*<br>
සංශෝධනය අංක 04 - 2021 මාර්තු මස 09 දිනැති අංක 2218/50 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*<br>
සංශෝධනය අංක 05 - 2022 අප්‍රේල් මස 29 දිනැති අංක 2277/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

*සටහන*<br>
2014 ඔක්තෝබර් 11 දිනැති අංක 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීමේදී ඉහත සඳහන් සංශෝධනය අංක 01 ඇතුළත් කර නොමැති බැවින් සංශෝධිත *ගැසට් පත්‍රවල* සඳහන් සංශෝධන අංක ඉහත පරිදි සංශෝධනය වේ.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II කොටස

7.2 අ 2 සහ 7.2 අ 5 යන උපවගන්ති පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

7.2 අ 2 බඳවා ගැනීම් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙහි අනුමත කරන ලද, පිළිගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයක හෝ ඕනෑම දේශීය වෛද්‍ය විද්‍යාලයක හෝ විදේශීය විශ්වවිද්‍යාලයක වෛද්‍ය පීඨයක වෛද්‍ය උපාධිය ලැබ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගනු ලබන රෝහලක වසරක අනිවාර්ය සීමාවාසික පුහුණුව සාර්ථක ලෙස නිම කරන ලදුව, වෛද්‍යවරයෙකු ලෙස සේවාව කිරීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලැබූ වෛද්‍ය උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබති.

*සටහන 1* - 1988 නොවැම්බර් 01 දිනට පසුව විදේශ වෛද්‍ය උපාධි ලැබූ ශ්‍රී ලංකා පුරවැසියන් සඳහා වෛද්‍ය ආඥාපනතේ 29.1(b) (II)(cc) සහ 29.2 (b) (III) යටතේ විශේෂ විභාගය සමත්ව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගනු ලබන රෝහලක එක් වසරක අනිවාර්ය සීමාවාසික පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතු ය.

7.2 අ 5. බඳවා ගැනීම, අයදුම්පත් කැඳවීම හා තෝරා ගැනීමේ ක්‍රමවේදය :

දෙපාර්තමේන්තු චක්‍රලේඛයකින් හා රජයේ *ගැසට් පත්‍රයේ* හා සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළකරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමක් මගින් ඉහත සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව පත්වීම් සඳහා වන ප්‍රමුඛතාවය පහත දක්වා ඇති පරිදි සලකා බලනු ලැබේ.

1. රාජ්‍ය විශ්වවිද්‍යාල වෛද්‍ය උපාධිධාරීන්
2. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අනුමත කරනු ලබන අනෙකුත් ඕනෑම දේශීය වෛද්‍ය විද්‍යාලයක වෛද්‍ය උපාධිධාරීන්
3. වෛද්‍ය සේවා ආඥාපනතේ 29.1(b) (II)(cc) සහ 29.2 (b) (III) වගන්ති යටතේ විශේෂ විභාගය සමග සුදුසුකම්ලත් විදේශ විශ්වවිද්‍යාල වෛද්‍ය උපාධිධාරීන්

තෝරා ගැනීම සිදු කරනු ලබනුයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සපයනු ලබන රාජ්‍ය විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ කුසලතා අනුපිළිවෙල, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල උපාධිධාරීන් හා අනෙකුත් දේශීය වෛද්‍ය විද්‍යාල උපාධිධාරීන්ගේ කුසලතා අනුපිළිවෙල සහ විදෙස් විශ්වවිද්‍යාල උපාධිධාරීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් සපයනු ලබන කුසලතා අනුපිළිවෙල අනුව ය. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව ඔවුන් වෛද්‍ය නිලධාරීන් ලෙස ප්‍රාථමික ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

ඉහත සංශෝධනයන් 2019.07.31 දින සිට බලාත්මක වේ.

EOG 12 - 0341

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.